අද වේදිකා නාට්‍යවලට විචාර කලාවක් නෑ

"හරි අපූරු දවසක්" වේදිකා නාට්‍යයේ අධ්‍යක්ෂ
චාමික හත්ලහවත්ත

ලාංකීය වේදිකා නාට්‍ය ඉතිහාසයේ ප්‍රථම වරට රාජ්‍ය නාට්‍ය උළෙලක හොඳම නාට්‍යයක් ජාත්‍යන්තර නාට්‍ය උළෙලක තරඟ වැදීමට තෝරා ගෙන තිබේ. ඒ චාමික හත්ලහවත්ත නමැති තරුණ නාට්‍යකරුවාගේ "හරි අපූරු දවසක්" වේදිකා නාට්‍යයයි. 2008 වසරේ දී රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳ නාට්‍යය ඇතුළු සම්මාන 6ක් හිමි කර ගත් මෙම නාට්‍යය කෙට (10) සිට 20 වැනිදා පිපිස්තුවේ "කයිරෝ අන්තර්ජාතික පර්යේෂණ නාට්‍ය උළෙලේ" දී තරඟ වදින්නේ ශ්‍රී ලාංකීය නාට්‍ය ලකුණ එහි තැබීමේ අරමුණ ඇතිවය. ලාංකීය නාට්‍යකරුවකුට ලැබෙන දුර්ලභ අවස්ථාවක් ලෙස මෙය සැලකේ. මේ නිසා චාමික හත්ලහවත්ත නමැති මේ තරුණ නාට්‍යවේදියා සමඟ කතාබහ කිරීමට අපි ඉඩ ප්‍රස්තාව සලසා ගත්තෙමු.

• ඔබ නිර්මාණය කළ 'හරි අපූරු දවසක්' වේදිකා නාට්‍යය කයිරෝ අන්තර්ජාතික පර්යේෂණාත්මක නාට්‍ය උළෙලට තෝරා ගෙන තිබෙනවා. ඒ පිළිබඳව අපේ සුබ පැතුම් ද එක් කරනවා. මේ පිළිබඳව නාට්‍යයේ නිමැවුම්කරු විදියට ඔබට මොකද හිතෙන්නේ?

වේදිකා නාට්‍යකරුවෙක් විදියට මම ඇත්තටම සතුටු වෙනවා මේවැනි අවස්ථාවක් ලැබීම ගැන. මේ කාල වකවානුවල මෙවැනි අවස්ථා අපට ලැබෙනව අඩුයි. 60, 70 දශකයේ ගොඩාක් නාට්‍යකරුවන්ට මෙවැනි අවස්ථා ගොඩාක් ලැබුණා. නමුත් අපට ලැබුණු අවස්ථා බොහොම සීමිත ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ නිසා මේ අවස්ථාවෙන් විදේශීය රටකට යන්න ලැබීම ගැන නොවෙයි සතුටු වෙන්නේ, නාට්‍ය නරඹන්න ලැබීම, ඒ නාට්‍ය සමඟ තරඟ කරන්න ලැබීම ගැනයි සතුටු වෙන්නේ. මෙවැනි තරඟයකට ඉදිරිපත් වෙන්න ලැබීම මට පෞද්ගලිකවට වඩා සමස්ත ලාංකීය වේදිකා නාට්‍ය කලාවටම ලැබූ අවස්ථාවක් ලෙසයි මා සලකන්නේ.

• ඔබ පැවසූ විදිහට මෙය ලාංකීය වේදිකා නාට්‍ය කලාවේ විශාල සලකුණක්. රාජ්‍ය නාට්‍ය උළෙලක හොඳම නාට්‍යයක් අන්තර්ජාතික නාට්‍ය තරඟයකට සුදුසුකම් ලැබූ ප්‍රථම අවස්ථාවක් මෙයයි. එහෙම නේද?

ඔව්. මගේ "හරි අපූරු දවසක්" නාට්‍යය 2008 වසරේ දී හොඳම නාට්‍ය ඇතුළු සම්මාන 6 ක් හිමි කර ගත්තා.

මම ඊට පෙරත් සම්මුඛ සාකච්ඡාවල දී විශේෂයෙන් ඔබ සමඟත් මේ ගැන කතා කරලා තිබෙනවා. මම කවදාවත් රාජ්‍ය නාට්‍ය උළෙලට නාට්‍ය ඉදිරිපත් කළාට පසු මගේ වැඩේ ඉවරයි කියලා හිතන්නේ නෑ. මම නිරන්තරයෙන්ම ලංකාව



හරි අපූරු දවසක් කයිරෝ අන්තර් ජාතික පර්යේෂණ නාට්‍ය උළෙලට

පුරාම දර්ශන වේදිකාගත කරන්න උනන්දු වෙනවා. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ද අනුමත කරගෙන පුළුවන් තරම් නාට්‍ය ගෙනි යන්න උත්සාහ කරනවා. අපි බැණ බැණ ඉඳලා වැඩක් නෑ. අවස්ථා ලැබෙන්නේ නෑ කියලා. පුළුවන් තරම් අපි අවස්ථා හදාගත යුතුයි.

අපි ඉන්දියාවේ භාරත රංග මහෝත්සවයට නාට්‍ය ඉදිරිපත් කරන්න උත්සාහ කළා. නමුත් ඒ සඳහා යන්න අවස්ථාවක් ලැබුණේ නෑ. මම උත්සාහ කළේ ලංකාවට පමණක් නොවෙයි අපි කොහොමද මේ ලැබුණු අවස්ථාව ඉදිරියට ගෙනි යන්නේ කියලයි. ගමට නගරයට පමණක් නොව අන්තර්ජාතිකව ගෙනි යන්නේ කොහොමද කියලයි මම හිතන්නේ. මම සම්මාන ලබා ගැනීමෙන් හෝ ලැබෙන යකඩ කැල්ලෙන් හෝ ලැබෙන මුදල් ටිකෙන් අපි සෑහීමකට පත්විය යුතු නෑ. අපි ලංකාවේ නාට්‍ය කලාව ගොඩ ගන්න නම් රට වැඩි ක්‍රියාදාමවලට යා යුතුයි. අපේ ව්‍යාපෘතිය සම්මානයෙන් පසු නතර නොකළ යුතුයි. පුළුවන් තරම් ඒ සඳහා උත්සාහ කළ යුතුයි.

මේ වෙලාවේ හැම විටම අප කරන්නේ සංස්කෘතික අමාත්‍යාංශයට හෝ රජයට චෝදනා කරන එකයි. හැබැයි මම මේ වෙලාවේ ඒ දෙකොටසට බොහොම ස්තුතිවන්ත වෙනවා අපට අන්තර්ජාතික නාට්‍ය උළෙලකට යන්න අවස්ථාව ලබා දීම ගැන. ඒ වගේම මම ඉල්ලීමක් කරනව මේ වැඩේ ඉදිරියට ගෙනි යන්න තව තවත් උළෙලවලට අපේ නාට්‍යවලට අවස්ථාව ලබා දෙන්න කියලා. ජයග්‍රහණය කළ නාට්‍ය පමණක් නොව ප්‍රශස්ත මට්ටමේ පර්යේෂණාත්මක නාට්‍ය නිර්මාණ ද අපේ රටේ තිබෙනවා. ඒවාටත් අවස්ථාව ලබා දෙන්න. නාට්‍ය ගමට, නගරයට පමණක් නොව අන්තර්ජාතිකව ගෙනි යන්න වැඩ පිළිවෙළක් මේක පදනමක් කරගෙන හදා ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

• අද දවසේ දී සමහර ප්‍රවීණ නාට්‍යකරුවන් පවා පවසන්නේ අපට වෘත්තීය රඟහලක් නාට්‍ය සංස්කෘතියක් නෑ කියලා. ඔබ කොහොමද මේ ප්‍රකාශය ගැන හිතන්නේ?

ඔය ගොඩාක් ගැටලු තිබෙනවා. අපි නිරන්තරයෙන්ම කතා කරන්නේ එකම දේ. අපට වෘත්තීය රඟහලක් නෑ. වෘත්තීය මට්ටමක් නෑ වැනි දේවල් මේ සියලුම ප්‍රශ්න අපට තිබෙනවා. අද දවසේ දී අපි දැන් ඔවැනි දේවලට කෑ ගසමින් නාට්‍ය නොකර හිටියොත් හරි යනවා ද? අපට තියෙන පහසුකම්වලින් නාට්‍ය කරන්න සිද්ධ වෙනවා. අද අපට නාට්‍යයක් කරන්න නිෂ්පාදකයෙක් නෑ. නමුත් නිෂ්පාදකයෙක්

සමහර නාට්‍යකරුවන් නාට්‍ය කරන්නේ තමන්ගේ බිරිඳගේ මාල උකස් කරලයි

නෑ කියලා මම නාට්‍ය අතහැරලා හිටියොත් වැඩක් වෙනවා ද?

තරුණ නාට්‍යකරුවෝ මේක පවත්වාගෙන යන හැටි පොඩ්ඩක් හිතන්න. නිෂ්පාදකයෙක් නෑ. කිසිම අනුග්‍රහයක් නෑ. කිසිම දෙයක් නැතුව පවත්වාගෙන යනවා. මූල්‍ය ලාභයක් තිබෙනවාද, ඒත් නෑ. ඇයි එහෙම නම් පවත්වාගෙන යන්නේ? අපි මේ මොහොතේ දී කරන්නේ සමාජ කර්තව්‍යයක්. සියලුම වේදිකා නාට්‍යකරුවෝ කරන්නෙ සමාජ කර්තව්‍යයක්. මේ සමාජ වපසරියේ හැම දෙයක්ම කරන්නේ ආර්ථික පසුබිමක් එක්කයි. ඒ ආර්ථික පසුබිමක් නැතුව නාට්‍ය ඉදිරියටම අරගෙන යනවා. ඒක තමයි අපේ වේදිකා නාට්‍ය කලාවේ තිබෙන වඩා වැදගත්කම. අපි ඉල්ලීම් කරන්න ඕනෑ ඒ වෙනුවෙන් කෑගසන්න ඕනෑ. හැබැයි ඒවාට විතරක් සීමා නොවී අපි උත්සාහ කරන්න ඕනේ අපේ නාට්‍ය පුළුවන් තරමින් අපේ මේ තිබෙන දුප්පත් වටපිටාව තුළ ඉදිරියට ගෙනි යන්න.

ඉල්ලීම් ඉල්ලමින් සටන් කරන්න ඕනේ. හැබැයි ඒ සමඟම අපි වැඩ කරන්න ඕනේ. සටන් විතරක් කළොත් ඉතුරු වන්නේ සටන් පමණයි. නිර්මාණ ඉතුරු වන්නේ නෑ. මගේ දැක්ම වයයි. කෙසේ වෙතත් අද දවසේ තරුණ සියලුම නාට්‍යකරුවන් මේ වෙනුවෙන් වැඩ කරනවා. එය සතුටට කරුණක්.

• ඔබ ඔහොම පැවසුවත් තරුණ නාට්‍යකරුවන් අද දවසේ දී නාට්‍යමය ගුණාංග නැති කරමින් වේදිකා නාට්‍ය නිර්මාණ වෙනත් අරමුණු කරා රැගෙන යන බවක් පෙනෙනවා. ඔබ කොහොම ද ඒ තත්ත්වය දකින්නෙ?

නාට්‍ය නිර්මාණයේ දී අපි නිර්මාණශීලිභාවය ගැන හිතන්න ඕනේ. අපට තිබෙන්නේ දේශපාලන වේදිකාවක් නොවෙයි. නාට්‍යකරුවාට දේශපාලනයත් අවශ්‍යයි. තමන්ගේ කෘතිය තුළ දේශපාලනයක් තිබිය යුතුයි. ඒ දේශපාලනය කතා කරන්න ඕනේ අපේ රංගන පරමභව තියාගෙනයි. ඒක තමයි වඩා වැදගත් වෙන්නේ. සුගතපාල ද සිල්වා නාට්‍යකරුවා දෙස බලන්න. අද දවසේ දී සුගතපාල ද සිල්වා නැවත කියවනවා නම් හොඳයි. එතුමා ගැඹුරු දේශපාලන දැක්මක් කතා කරනවා. හැබැයි අර රංග පරමභව හෝ නිර්මාණශීලි බව අත්හැරියේ නෑ. නිකම් දේශපාලන කතන්දරයක් වේදිකාවට අතහැරියේ නෑ. ඒවා කතා කළේ රංග පරමභව තියාගෙනයි. එතුමා පරිවර්තනයක් කළත් අනුවර්තනයක් කළත් ඒක ලාංකීය පොළොවට ගැලපෙන ලෙස නිර්මාණය කළා. ඔහුව නැවත හඳාරනවා නම් තරුණ නාට්‍යකරුවන්ට වඩා යහපත් නිර්මාණ කරන්න පෙළැඹීමක් ඇති වේවි කියා මා හිතනවා. මගේ දේශපාලනය මම කතා කරන්නේ නිර්මාණශීලිභාවය හා රංග පරමභව තියාගෙනයි. ඒක බිඳිමින් වැඩ කරන්නේ නෑ.

• එහෙම වෙන්න හේතුව සමහරු යල් පැන ගිය සාම්ප්‍රදායික මති මතාන්තර එල්බ ගෙන සිරණ ගැනීම හින්දා නේද?

ඔව්. අපට තවම වේදිකා නාට්‍ය කලාවට හොඳ විචාර කලාවක් නැහැනේ. අපේ ලංකාව ඇතුළේ තිබෙන ලොකු ගැටලුවක් ඒක. අපේ නාට්‍ය කලාවේ පෞද්ගලික කාරණා මත තමයි විවේචන සිදු වන්නේ. ඒක වැරදියි. පුළුල් විදිහට බලන විචාර කාලවක් තිබිය යුතුයි. නිර්මාණ කලාව වර්ධනය වෙනවා වගේම රට සමාන්තරව විචාර කලාව වර්ධනය විය යුතුයි. නාට්‍යකරුවන් නාට්‍ය කරන්නේ බොහෝ විට තමන්ගේ බිරිඳගේ මාල උගස් කරලා බැංකුවට ණය වෙලයි. මාත් නාට්‍ය කළේ එහෙමයි. එහෙම නාට්‍යකරුවකුගේ නාට්‍යයකට විරෝධය එල්ල කිරීමට පෙර දෙවරක් සිතිය යුතුයි. අද දවසේ දී ගැටලුව තිබෙන්නේ අපි නිර්මාණශීලිභාවයෙන් නාට්‍ය කොයි තරම් දුරට පොහොසත් කරනවා ද කියන එකයි.

සංවා
සමන්ත යහම්පත්

Scan with EasyScan